# රසායනාගාර සහායක තනතුර සඳහා බඳවා ගැනීම

Print

**ජාතික ඖෂධ නියාමන අධිකාරිය**

**තනතුරු පුරප්පාඩු සඳහා දැන්වීමයි.**

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායකත්වය දරණ තනතුරු වන අතර ස්ථාන මාරු වීම් රහිත වේ.

ජාතික ඖෂධ නියාමන කොළඹ පමණක් පිහිටුවා ඇති අතර ශාඛා කාර්යාල නොමැත.

**01. රසායනාගාර සහායක : (පුරප්පාඩු ගණන 08 යි)**

සුදුසුකම්:

**බාහිර අයදුම්කරුවන්**

1. රසායනාගාර සහායක තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහිතව විෂයයන් හය(06) සමත් වී තිබීම හා වසර එකක (01) අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන, වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්.

හෝ

2. එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

3. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහිතව විෂයයන් හය(06) සමත් වී තිබීම හා (PL 1) සේවා ගණයක අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර එකක (01)ක පළපුරුද්ද.

වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

තනතුරට අදාළ වැටුප් පියවර : කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි PL 2-2016 රු.(25,750 -10X270 – 10X300 – 10X330 – 12X350 -38,950/-) වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු.25,750 හා අනුමත දීමනා

බඳවා ගැනීමේ ක්‍රමය : පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තුන්වන (III) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**වෙනත් කරුණු** :-

සෑම ඉල්ලුම්කරුවක් ම,

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

පහත ආකෘතිපත්‍රයට අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.02.19 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ප්‍රධාන විධායක නිළධාරි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය.

සභාපති,

ජාතික ඖෂධ නියාමන අධිකාරිය.

---

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

........................ තනතුර සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම :-

2. මුලකුරු සමඟ නම:-

3. ලිපිනය:-

4. පදිංචි දිස්ත්‍රික්කය:-

5. උපන් දිනය:-

6. වයස:- අවු:.................. මාස: .................... දින: ...................

7. ස්ත්‍රී/ පුරුෂ භාවය:-

8. ජාතික හැඳුනුම්පත් අංකය:-

9. දුරකථන අංකය :- ස්ථාවර: .......................... ජංගම : ..............................

10. විද්‍යුත් තැපැල :-

11. අධ්‍යාපන සුදුසුකම්:-

12. වෘත්තීය සුදුසුකම් :-

13. පළපුරුද්ද :-

14. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක හා ලිපිනයන්:-

මෙහි ඉහතින් දක්වා ඇති මා පිලිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය: ...................................

(ඉල්ලුම්කරුගේ අත්සන)

සැළකිය යුතුයි:-

අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍ර වල පිටපත් අයදුම්පත්‍රය සමඟ යොමු කල යුතු වේ.

*Published: 09 December 2021*